# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.03.27

වේලාව - ප.ව. 01.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - එම්.ඒ.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ.චම්පිකා කනේරු මිය**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්.බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා.**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **චම්පිකා පතිරණ මිය.**
  **ප්‍රධාන අභ්‍යන්තර විගණක.**
- **නිශාන්ති විජේසුන්දර**
  **අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)**
- **ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය.**
  **අධ්‍යක්‍ෂ (ඉංජිනේරු)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **එල්.ඒ.බී.එල්,ගුණසේකර මිය.**
  **ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)**
- **පී. කණිෂ්ක ශ්‍රී ලාල් මයා.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**
- **කේ.එන්.සූරියආරච්චි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

# සාකච්ඡා කරන ලද කරුණු

## පාලන අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | තොරතුරු දැන ගැනීමේ පනතේ රීති පිළිබඳ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම හා එම පනතේ V වන කොටසෙහි 26 වන රීති ප්‍රකාරව සෑම කාර්යාලයක් ඉදිරිපිටම එකී රීති ප්‍රදර්ශනය කිරීම. | සියලු ම ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන්. |

## පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර | නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර වෙනුවෙන් සුදුසු පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංශෝධන සඳහා නැවත ඉදිරිපත් කර ඇති බව ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදි.<br>එය සංශෝධනය කර, නොපමාව යවන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහායකයින් බඳවා ගැනීම | තාක්ෂණ නිලධාරි බඳවා ගැනීම් පටිපාටියේ ද අඩුපාඩු ඇති බැවින්, සංශෝධනය කර, නැවත යොමු කිරීම.<br>තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව තාක්ෂණ සහායකයින් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

## සැලසුම් අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සංවර්ධන යෝජනා සම්බන්ධ ප්‍රගතිය | ඉදිකිරීම් නොවන සංවර්ධන ව්‍යාපෘති, පසුවිපරම් කිරීම හා එක් එක් අමාත්‍යාංශ මඟින් මේ වන විට ඉටු කර නොමැති ව්‍යාපෘති වල තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතු ව ලිපි යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 02. | බස්නාහිර පළාත් සභාව සඳහා සංවර්ධන ලොතරැයියක් හඳුන්වා දීම. | ඒ සඳහා ඉලෙක්ට්‍රොනික ලොතරැයි පතක් නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බවත්, ඒ සඳහා ප්‍රඥප්තියක් සැකසීම කෙරෙහි මේ වන විටත් අවධානය යොමු කර ඇති බවත්, ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කර සිටින ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

## ඉංජිනේරු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයේ දී ඇති වන දෝෂ. | පසුගිය මාස කිහිපය තුල සියලු නිලධාරීන් අන්තර්ජාලය භාවිතා කරන ලද ආකාරය පිළිබඳ වාර්තාවක් ලබා දෙන මෙන් බී.ඩී.පී.නිරන්ජන් මහතා වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | නව ගොඩනැගිල්ල තුල ප්‍රධාන ලේකම් කාර්යාලය ක්‍රියාත්මක මට්ටමින් ස්ථාපනය කිරීම. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ එක් එක් අංශ නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අදාළ ව විශේෂිත දින වකවානු පිළිබඳ ව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) පැහැදිලි කරන ලදි.<br><br>1. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) – 2017 සැප්. 01<br>2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) – 2017 සැප්. 10<br>3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) – 2017 සැප්. 15<br>4. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) – 2017 ඔක්. 01<br>5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - 2017 ඔක්. 01<br>6. ප්‍රධාන ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) – 2017 නොවැ. 01<br><br>වෙන් කිරීම් (Partition) සඳහා ක්‍රියා කිරීමේ දී දැනට සිටින සේවක සංඛ්‍යාව නොසලකා අවකාශ කළමනාකරණය (Space Management) උපරිම අයුරින් භාවිතයට ගැනීම හා ඒ සඳහා දැනට භාවිතා කරනු ලබන ලී බඩු හා කාර්යාල උපකරණ නැවත ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම.<br><br>ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ්අඩවි භාරව කටයුතු කිරීම, නඩත්තු කිරීම ලිපි හා ලිපිගොනු ඩිජිටල් තාක්ෂණය යටතේ සංරක්ෂණය කිරීම ආදී වගකීම් ITRDI ආයතනය වෙත පැවරීම කෙරෙහි අවධානය යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |